**ශීර්ෂය 174 - පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයෙහි අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| **232** | **බන්ධනාගාර දෙපාර්තමේන්තුව.** |
| **326** | **ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව.** |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා දෙපාර්තමේන්තුවල ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| **ශීර්ෂය** | **අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය** |
|---|---|---|
| 174 | පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 2015 ජූලි 30 දින |
| 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 2015 අගෝස්තු 10 දින |
| 326 | ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 2015 ජූලි 21 දින |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම.**

විසර්ජන ගිණුම්, වානිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 6,853.10 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 6,589.83 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 8.52 ක සිට රු.මිලියන 216.29 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.11 ක සිට සියයට 18.0 ක් දක්වා පරාසයක පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 174 | 765.48 | 756.96 | 8.52 | 1.11 |
| 232 | 5,873.90 | 5,657.61 | 216.29 | 3.68 |
| 326 | 213.72 | 175.26 | 38.46 | 18.00 |
| **එකතුව** | **6,853.10** | **6,589.83** | **263.27** | **3.84** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 17401 | 4.0 | 3.4 | 1.2 | 1.9 | 12.0 | 8.5 |
| 23201 | 120.0 | 111.6 | 100.0 | 104.3 | 450.0 | 267.6 |
| 32601 | 9.0 | 8.9 | 3.5 | 4.3 | 40.0 | 19.1 |

### 2.2.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ ඇති බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්මික හා කෘෂිකාර්මික කටයුතු සඳහා වාණිජ අත්තිකාරම් ගිණුමක් පවත්වා තිබුණි.

**(අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

වාණිජ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 23202 | 75.0 | 74.8 | 125.0 | 131.4 | 65.0 | 38.1 |

**(ආ) මූල්‍ය ප්‍රතිඵල**

වාණිජ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵලය පහත පරිදි විය.

| විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල 2014 ලාභය කල්පිත ගාස්තු රහිතව | 2014 පාඩුව කල්පිත ගාස්තු සහිතව | 2013 ලාභය කල්පිත ගාස්තු රහිතව | 2013 පාඩුව කල්පිත ගාස්තු සහිතව |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 23202 | බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු | 49.9 | 10.4 | 38.0 | 5.5 |

## 2.3 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු දෙකක 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 29.2 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 7002/0000/00/0078/0014/000 | 3.4 |
| | 7002/0000/00/0079/0014/000 | 10.4 |
| ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 7002/0000/00/0412/0014/000 | 15.4 |
| **එකතුව** | | **29.2** |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු දෙකක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 110.7 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| **පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය** | 6000/0000/00/00 | 2.1 |
| **බන්ධනාගාර දෙපාර්තමේන්තුව** | | |
| තැන්පත් ඇප. | 6000/0000/00/0001/0016/000 | 1.0 |
| තැන්පත් -ටෙන්ඩර්. | 6000/0000/00/0002/0017/000 | 3.5 |
| සිරකරු සුභසාධක අංශය. | 6000/0000/000/0006/0081/000 | 4.5 |
| සිරවේතන සහ පුද්ගලික මුදල් ගිණුම. | 6000/0000/00/0006/0081/000 | 4.2 |
| විවිධ තැන්පත් ගිණුම. | 6000/0000/00/0015/0112/000 | 95.2 |
| **ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව** | 6000/0000/00/0015/0180/000 | 0.2 |
| **එකතුව** | | **110.7** |

## 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්, වාණිජ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 5 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

## 3. ශීර්ෂ ය 174 - පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, එක් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454(1) | පවත්වා නොතිබුණි. |
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |

## 3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම

අමාත්‍යාංශය වෙත ඉකුත් වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුමට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.1,295,069 ක් විය.

## 3.4 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබුණු රු.17,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 ක සිට සියයට 87 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය.

විෂය අංක 17401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදි ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 13.6 වගන්තියට පටහැනිව ලිත් වර්ෂයකට වරක් පමණක් උත්සව අත්තිකාරම් ලබාදිය යුතු වුවද, 2014 වර්ෂයේදී නිලධාරියෙකුට වර්ෂය තුළ දෙවරක් උත්සව අත්තිකාරම් ලබාදී තිබුණි.

## 3.6 අභ්‍යන්තර විගණනය

අමාත්‍යාංශය සතුව අභ්‍යන්තර විගණන ඒකකයක් පැවතියද ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් 2014 වර්ෂයේදී සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ii) 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 09 | 02 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | - | - |
| (iii) | ද්විතියික මට්ටම | 68 | 43 | 25 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 18 | 01 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | එකතුව | 100 | 74 | 28 | 02 |

අනුමත සේවක සංඛ්‍යාවෙන් පරිබාහිරව මාධ්‍ය ඒකකය සඳහා අනියම් නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන තිබුණි.

**4. ශීර්ෂ 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව.**

**4.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාල ස්ථාවර වත්කම් ලේඛනය. | මුදල් රෙගුලාසි අංක 502(2) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (iv) | බන්ධනාගාර ගොවිතැන් රෙජිස්ටරය, අස්වැන්න රෙජිස්ටරය, ගව රෙජිස්ටරය, බිත්තර රෙජිස්ටරය හා කිරි ලබා ගැනීමේ වාර්තා, | බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග අංක 910, 911, 914, 915 හා 921 | පවත්වා නොතිබුණි. |

**4.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 03 කට 2015 ජුනි 30 දින වන විටද, පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රුපියල් මිලියන 3,770 ක් විය.

**4.3 විසර්ජන ගිණුම**

**වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන**

එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන මගින් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත රු.19,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.8,994,374 ක් වැය කර තිබුණි. ඉතිරි ප්‍රතිපාදනය පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මගින් ආපසු ලබාගෙන තිබුණු අතර, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු මන්දගාමී තත්ත්වයක පැවතුණි.

**4.4 පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.18,584,789 ක්වූ තැන්පතු 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) පුනරුත්ථාපන අධිකාරීය විසින් දැයට කිරුළ වැඩසටහනට දෙන ලද රු.166,832 ක මුදල් අදාල කාර්යය භාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ සිට මූලධන වියදම් සඳහා සළසා තිබූ ප්‍රතිපාදන වලින් රු.4,188,194 ක් සැපයුම්කරුවන් වෙත නොගෙවා තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඈ) රක්ෂණ ආයතනයකින් ලැබී තිබුණු රු.10,812 ක රක්ෂණ වන්දියක් රු.10,812 ක් ආදායමට නොගෙන පොදුතැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඉ) 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට හා ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවිය යුතු එකතුව රු.52,740 ක් තැන්පත් ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

## 4.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 23201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව දැනට සේවයේ යෙදී නොසිටින නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.12,003,627 ක් වූ ණය ශේෂවලින් රු.2,687,729 ක ණය ශේෂ වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.6 වාණිජ අත්තිකාරම් ගිණුම්

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් විෂය අංක 23202 දරන බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු පිළිබඳ අත්තිකාරම් කාර්යයට අදාළ අත්තිකාරම් ගිණුමේ කටයුතු ඉටු කර තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කළ එම ගිණුම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) අත්තිකාරම් ගිණුමේ අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.62,273,889 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ii) වැලිකඩ බන්ධනාගාරයේ ගරාජය කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය වෙත පවරා දී තිබුණත්, රු.155,910 ක තොග ශේෂය වැලිකඩ බන්ධනාගාරයේ පොත්වල පෙන්වා තිබුණි.

(iii) බන්ධනාගාර ආයතන 4 ක එකතුව රු.1,443,935 ක්වූ සත්ව තොග කපාහැරීම් මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(iv) කුරුවිට බන්ධනාගාරයේ 2013 වර්ෂය අවසානයට වූ රු.102,679 ක් වූ අමුද්‍රව්‍ය තොගය එම වර්ෂයේ ලාභයට ගැලපීම් කර තිබුණි. නමුත් එම ගැලපීම ඉකුත් වර්ෂයේදී සිදු කර නොතිබුණු ලෙස සළකා සමාලෝචිත වර්ෂයේදීද ලාභයටද ගලපා තිබුණි.

## 4.7 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i). මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයෙන් බන්ධනාගාර ආයතන තුනකට ලබාදුන් ලොරි රථ දෙකක් හා මෝටර් රථයක් දිරාපත් වෙමින් පැවතුණි.

(ii). පල්ලෙකැලේ එළිමහන් කඳවුර වෙත 2013 වර්ෂයේදී වාහන සේවා කටයුතු සඳහා ලබාදෙන ලද බර එසවුම් යන්ත්‍ර හා අවශ්‍ය අනෙකුත් උපාංග සඳහා රු.2,395,000 ක් වැයකර තිබුණද, අවශ්‍ය විදුලි ධාරිතාව සම්පාදනය කර නොතිබීම හේතුවෙන් නිෂ්ක්‍රියව පැවතුණි.

(iii). දෙපාර්තමේන්තු නිලධාරීන්ට අවශ්‍ය පාවහන් නිෂ්පාදනය කිරීම සඳහා රු.3,575,000 ක් වැයකර යන්ත්‍ර 2 ක් මිලදී ගෙන තිබූ අතර 2010 වර්ෂයේ සිට නිලධාරීන් පුහුණු කිරීමේ, අළුත්වැඩියා කටයුතු හා ඉදිකිරීම් සඳහා රු.1,796,964 ක් වැයකර තිබුණත්, එම යන්ත්‍රවලින් නිෂ්පාදන කටයුතු 2014 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භකර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). 2014 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි**.**

(ii). 1984 නොවැම්බර් 31 දින ඩොලර් ෆාම් හා කෙන්ට් ෆාම් ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් විනාශ වූ අයිතම 61 ක් පමණ පොතෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

විධිමත් පරිදි පවරා ගෙන නොතිබුණු ඉඩම්වල දෙපාර්තමේන්තුව විසින් බන්ධනාගාර ආයතන ඉදිකර තිබුණි. විස්තර පහත දැක්වේ.

| | බන්ධනාගාර ආයතනය | ඉඩමේ අයිතිය | ප්‍රමාණය |
|---|---|---|---|
| (i) | හලාවත සිර මැදිරිය | පොලිස් දෙපාර්තමේන්තුව | පර්චස් 12 |
| (ii) | බූස්ස බන්ධනාගාරය | ප්‍රාදේශීය ලේකම් | හෙක්ටයාර් 2.778 |
| (iii) | වටරැක එළිමහන් සිර කඳවුර | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | අක්කර 33 රූඩ් 01 පර්චස් 38 |

**(ඈ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්.**

දෙපාර්තමේන්තුව විසින් වර්ෂ ගණනාවක් මහර බන්ධනාගාරය සතු නිළ නිවාස තුනක් පොලිස් නිලධාරීන් වෙත ලබාදී තිබුණි. එම නිවාස පරිහරණය කළ නිලධාරීගෙන් එම නිවාස වල ජල ගාස්තු, විදුලි ගාස්තු හා ආර්ථික කුලිය අයකර ගෙන නොතිබුණි.

**4.8** **බේරුම් නොකළ බැරකම්**

**---------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.283,556,599 ක් වූ අතර, ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි.

**4.9** **අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (අ) | මුදල් රෙගුලාසි 396(ඇ) | 261,981 | කළුතර බන්ධනාගාර කාර්යාලයෙන් නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 6 ට වඩා කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 446(2) | 5,872,182 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ 2012 වර්ෂයේ සිට පැවත එන හඳුනා නොගත් ලැබීම් හා ගෙවීම් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 104 | 591,640 | දෙපාර්තමේන්තුවේ වාහන පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂාවකදී සමාලෝචිත වර්ෂයේ අනතුරට පත්වූ වාහන 8 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | මුදල් රෙගුලාසි 109(I) | | බන්ධනාගාර ආයතනවල සතුන් මියයෑම, නොමිලයේ බෙදාහැරීම වැනි කටයුතුවලදී පොතෙන් අස්කිරීමේ නියෝග ලබාගෙන නොතිබූ අතර, එම අස්කිරීමේ නියෝග විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**4.10** **දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

--------------------------------------------------------

**ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

--------------------------------------

දුම්බර බන්ධනාගාරයේ කුළුණ සහිත ජල ටැංකිය ඉදිකිරීමට රුපියල් මිලියන 36.9 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. එම ඇස්තමේන්තුව අනුව ඉදිකිරීම මාස 6 කින් නිම කිරීමට සැලැසුම් කර තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තු කළ වටිනාකමෙන් සියයට 20 ක් හෙවත් රු.මිලියන 11.8 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් 2012 ජනවාරි මාසයේදී ගෙවා තිබුණි. ඉදිකිරීම් කිරීමට යෝජිත ඉඩමෙහි පාංශුගෙවා තිබුණි. සකස් කර මාස 6 කින් නිම කිරීමට සියයට 20 ක් වූ රු.මිලියන 11.8ක අත්තිකාරම් මුදලක් 2012 ජනවාරි මාසයේදී ගෙවා තිබුණි. නමුත් එම ස්ථානයේ පාංශු දුබලතාවයක් නිසා ව්‍යාපෘතිය අඩාල වී තිබුණි.

**4.11** **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

--------------------------------------

**(අ)** **අක්‍රීය බැංකු ගිණුම්**

---------------------

බන්ධනාගාර රැඳවියන් වැටුපෙන් සියයට10 ක් බැගින් ලබාගෙන බන්ධනාගාර ත්‍යාග අරමුදල නමින් අරමුදලක් ස්ථාපිත කර තිබුණි. එම අරමුදල සඳහා ලැබෙන මුදල් රාජ්‍ය බැංකුවක, බැංකු ගිණුමක තැන්පත් කර තිබුණි. එම බැංකු ගිණුමේ මාසික ගිණුම් විස්තර ලබා ගෙන සැසඳීම් කර නොතිබුණි. එම ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට රු.4,402,503 ක ශේෂයක් පැවතුණි.

(ආ) ගැලපුම් කළයුතු ශේෂ

-----------------------

බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| **ගැලපුම් පිළිබඳ විස්තරය** | **කාල විශ්ලේෂණය** | | **එකතුව** |
|---|---|---|---|
| | **මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු** | **වර්ෂ 01 ට වැඩි 03 ට අඩු** | |
| | රු. | රු. | රු. |
| (i) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | - | 261,981 | 261,981 |
| (ii) හඳුනා නොගත් හර | 6,668,129 | 5,786,223 | 12,454,352 |
| (iii) හඳුනා නොගත් බැර | 1,253,826 | 5,827,172 | 7,080,998 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ හඳුනා නොගත් ලැබීම් රු.5,786,223 ක් 2012 ජනවාරි සිට පැවත එන චෙක්පත් 29 ක එකතුවක් වන අතර, 2012 සිට පැවත එන හඳුනා නොගත් ගෙවීම් රු.5,786,223 ක් චෙක්පත් 52 ක එකතුවකි. මෙම දෙපාර්තමේන්තුවේ දෛනිකව මුදල් පොත තුලනය කිරීම් හා අධීක්ෂණය නිසි පරිදි සිදු නොවන බව නිරීක්ෂණය විය.

## 4.12 අවිධිමත් ගනුදෙනු

----------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් 50,000,000 ක ප්‍රතිපාදන සළසාගෙන තිබුණද, ප්‍රසම්පාදනයට අවශ්‍ය මූලික ක්‍රියාවලිය හෝ ආරම්භකර නොතිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට අවශ්‍ය ජල බවුසර් 5 ක් හා ලොරි 10 ක් මිලදී ගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අධිකාර බලය නොමැති ගනුදෙනු අනාවරණය විය.

(i). දූම්බර බන්ධනාගාරයේ මුළුතැන්ගෙය ඉදිකිරීමේ මුල් ඇස්තමේන්තුව රු. මිලියන 22.6 ක් වී තිබුණි. ඉදිකිරීම් ප්‍රමාදවීම නිසා මුල් ඇස්තමේන්තු අගයන් වෙනස්වීම හා වාෂ්ප බොයිලේරු සවිකිරීමට ගොඩනැගිල්ල වෙනස් කිරීම හේතුවෙන් එම කාර්යය සඳහා රු. මිලියන 56.9 ක් වැය කර තිබුණත්, ඊට අවශ්‍ය විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ii). දූම්බර බන්ධනාගාරයේ මළ අපවහන පද්ධතියක් සකස් කිරිමට පෞද්ගලික සමාගමක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර, පද්ධතියේ ඉදිකිරීම් මිල ගණන් රුපියල් මිලියන 38 ක් ද, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සේවා ගාස්තු රු.2,960,000 ක් සහ භූමිය සැකසීමේ වියදම් රු.1,000,000 ක් ඇතුළත් කර තිබුණද, එම ඇස්තමේන්තු අගයන්වලට එළඹි ආකාරය විගණනයට ඉදිරිපත් කළ තොරතුරුවල ඇතුළත්ව නොතිබුණි.

(iii). දූම්බර බන්ධනාගාරයේ ඉදිකිරීම් අනුවිෂයයන් ලෙස සටහන්ව තිබුණු ආරක්ෂක තාප්පය හා කාන්තා අංශය, පරිපාලන ගොඩනැගිල්ල, මුළුතැන්ගෙය, ජල ටැංකිය හා පොම්ප කාමරය සඳහා ආරම්භක කොන්ත්‍රාත් වටිනාකම රු.75,746,881 ක් වුවද, පසුව කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ මිල රු.96,384,618 ක් වීම නිසා රු.20,637,737 ක මිල විචලනයක් නිරීක්ෂණය විය. ඉහත විෂයයන් වල මිල ගණන් වැඩිවීම සම්බන්ධයෙන් ගෙවීම් නිසි අනුමැතියකින් තොරව සිදු කර තිබුණි.

(iv). මුල් ඇස්තමේන්තුවට ඇතුළත් නොවූ දූම්බර බන්ධනාගාරයේ අතිරේක වැඩ කොටස් 5 ක් සඳහා රු.157,978,484 ක් ඉටුකර තිබුණද, එම වැඩ කොටස් සඳහා විධිමත් අනුමැතියක් ලබා නොතිබුණි.

(v). අඟුණකොලපැලැස්ස බන්ධනාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 3,214.1 ක් සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මිල ගණන් කැඳවීමේදී මුළු කොන්ත්‍රාත්තුව සඳහා රුපියල් මිලියන 3,575.9 ක මිල ගණන් ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණි. රුපියල් මිලියන 133.4 ක ප්‍රතිපාදන වශයෙන් එම කොන්ත්‍රාත් මුදලට එකතුකර තිබුණි.

### 4.13 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

------------------------------------------

අඟුණකොලපැලැස්ස බන්ධනාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව අදියර තුනකින් නිම කිරීමට සැලැසුම් කර තිබූ අතර, පළමු වැඩ ආරම්භක අත්තිකාරම් විධිමත් පරිදි උපයෝජනය කිරීමෙන් පසුව දෙවන අත්තිකාරම නිකුත් කළ යුතු බවට ගිවිසුමේ 14(2) වගන්තියෙහි දක්වා තිබුණි. ඒ පිළිබඳ සැලකීමකින් තොරව අදියර තුනටම අදාල මුළු කොන්ත්‍රාත්තු මුදල වූ රුපියල් මිලියන 3,709 ක් සඳහා සියයට 20 ක වැඩ ආරම්භක අත්තිකාරම් වශයෙන් රුපියල් මිලියන 801 ක් 2014 මැයි 05 දින කොන්ත්‍රාත් සමාගම වෙත නිකුත් කර තිබුණි. කොන්ත්‍රාත්කරු එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි අංක ඇතුළත් ඉන්වොයිසයියක් ඉදිරිපත් කර නොතිබුණු අතර රුපියල් මිලියන 85 ක එකතු කළ අගය මත බදුද ගෙවා තිබුණි. ගිවිසුමට පටහැනිව ගෙවන ලද රුපියල් මිලියන 400.5 ක අත්තිකාරම් මුදල සඳහා කොන්ත්‍රාත් සමාගමෙන් ආපසු රුපියල් මිලියන 9.4 ක පොලී මුදලක් අයකිරීමට මුල් ගිවිසුමට පරිබාහිරව සිදුකෙරෙමින් පවතින බව නිරීක්ෂණය විය.

### 4.14 අනාර්ථික ගනුදෙනු

---------------------

බෝගම්බර බන්ධනාගාරය කඩිනමින් විතැන් කිරීමේදී ගෙනෙන ලද කර්මාන්ත අංශයේ තිබූ වටිනා යන්ත්‍ර සූත්‍ර තාවකාලිකව ගබඩා කිරීමට මඩුවක් තැනීමට රු.4,283,455 ක් ගෙවීම් කර තිබුණි.

### 4.15 කළමනාකරණ දූර්වලතා

------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ). දුම්බර බන්ධනාගාරය ඉදිකිරීම කළමනාකරණය කිරීමට ව්‍යාපෘති කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබුණි. ඒ හේතුවෙන් සහ නිසි කළමනාකරණයක් නොතිබීම නිසා දොරටු වෙනස් කිරීම් සහිත අතිරේක වැඩ වශයෙන් කොන්ත්‍රාත් වටිනාකම රු.33,909,846 ක් වූ අතර, ඒ සඳහා රු.29,434,300 ක් වැය කර තිබුණි. කඩිනමින් විතැන් කිරීමේ කාර්යය සඳහා අප ජලය හා මළ අපද්‍රව්‍ය ඉවත් කිරීමට රු.17,275,000 ක් වැය කර තිබූ අතර, තාවකාලික ටැංකි ඉදිකිරීමට රු.8,883,853 ක් වියදම් කර තිබුණි.

(ආ). අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 3,214 ක් වූ ව්‍යාපෘති ය සඳහා කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබුණු අතර ජල පහසුකම් සහ විදුලිය ලබාගැනීම, මළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදයන් සැලැසුම් කර නොතිබුණි.

## 4.16 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 95 | 52 | 43 | - |
| (ii) | තෘතියික මට්ටම | 6,642 | 5,011 | 1,631 | - |
| (iii) | ද්විතියික මට්ටම | 509 | 294 | 215 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 364 | 333 | 31 | - |
| (v) | අනියම් | - | 04 | - | 04 |
| | **එකතුව** | **7,610** | **5,694** | **1,920** | **04** |

අනියම් පදනමට බඳවාගන්නා ලද සේවකයන් 04 දෙනෙකු ස්ථිර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

# 5. ශීර්ෂ 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව.

## 5.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි අංක 891(1) | පවත්වා නොතිබුණි |
| (ii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි අංක 110 | පවත්වා නොතිබුණි |
| (iii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි අංක 214 | පවත්වා නොතිබුණි. |
| (iv) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (v) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 | පවත්වා නොතිබුණි |
| (vi) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි |

## 5.2 සීමා නොපිළිපැදීම

---------------------

දෙපාර්තමේන්තුවේ විෂය අංක 32601 දරන රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම සඳහා පාර්ලිමේන්තුව විසින් උපරිම වියදම් සීමාව රු.9,000,000 ක සීමාවක් පනවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම අත්තිකාරම් කාර්යෙහි වියදම රු.9,105,402 ක් වී තිබුණි. ඒ පාර්ලිමේන්තුව පනවා තිබුණු වියදම් සීමාව රු.105,402 කින් ඉක්මවා වියදම් කර තිබුණි.

## 5.3 විසර්ජන ගිණුම

-----------------

**අයවැය විචලනය**

--------------------

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 5.4 අග්‍රිම ගිණුම්

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන් 22 කට අවස්ථා 46 කදී එකතුව රු.614,570 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුත් වුවත්, අවස්ථා 67 කට අදාලව ලබා දි තිබුණු එකතුව රු.698,407 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාස 01 ක සිට මාස 9 ක් දක්වා කාල පරාසයක පමාවකින් පසු නිරවුල් කර තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පියවා අවසන් කල යුතු වුවත්, අවස්ථා 3 කදී ලබා දි තිබුණු එකතුව රු.14,150 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 2015 ජුනි 30 දින වන විටත් පියවා නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000 ක් වී තිබුණත්, එම රෙගුලාසිවලට පටහැනිව අවස්ථා 04 කදී එකම කාර්යය සඳහා මාණ්ඩලික නොවන පුද්ගලයින් කිහිපදෙනෙකු අතර රු.225,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**5.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 32601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.691,692 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ආ) වර්ෂ 04 කට ආසන්න කාලයක සිට වැඩ තහනමට ලක්වූ නිළධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.249,166 ක් වූ ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**5.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර ඇති ක්‍රියාකාරී සැලැස්ම උක්ත චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

**5.7 වත්කම් කළමනාකරණය.**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2015 ජුනි 30 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**5.8 බේරුම් නොකළ බැරකම්.**

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයක අඩු කාලයක සිට පැවැත එන එකතුව රු.477,771 ක් වූ බැරකම් පැවැතුණි.

**5.8 කාර්යසාධනය**

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන**

දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුක කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) "ප්‍රජා විශෝධන ආඥා ප්‍රමාණය වැඩිකර ගැනීම" වැඩසටහන යටතේ විනිසුරුවන් හා නීතිඥවරුන් දැනුවත් කිරීම සඳහා ව්‍යාපෘති 20 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ඉන් 12 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ආ) "ප්‍රජා විශෝධන ආඥා ප්‍රමාණය වැඩිකර ගැනීම" වැඩසටහන යටතේ ප්‍රාදේශිය කාර්යාල අධීක්ෂණය සඳහා ව්‍යාපෘති 97 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණද, කාර්යාල 61 ක් පමණක් අධීක්ෂණය කර තිබුණි.

(ඇ) "ප්‍රජා විශෝධන ආඥාලාභීන් සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම" වැඩසටහන යටතේ අධ්‍යාත්මික සංවර්ධන ව්‍යාපෘති 400 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණද, ඉන් ව්‍යාපෘති 274 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඈ) "ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ සංවර්ධනයට යොදාගැනීම" වැඩසටහන යටතේ විශේෂ ව්‍යාපෘති හරහා ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ ආර්ථිකයට දායක කර ගැනීමේ ව්‍යාපෘති 90 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම්කර තිබුණද, ව්‍යාපෘති 55 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඉ) "ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ සංවර්ධනයට යොදාගැනීම" වැඩසටහන යටතේ ශ්‍රමදාන වැඩ සටහන් 750 ක් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණද, ව්‍යාපෘති 669 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

## 5.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### (අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්.

බැංකු ගිණුම් 01 කට අදාල 2014 දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් ප්‍රකාශය 2015 මාර්තු 15 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### (ඇ) ගැලපුම් කළයුතු ශේෂ

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i). නිකුත් කර තිබුණත්, බැංකුවට ඉදිරිපත් වී නොතිබුණු එකතුව රු.4,627 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii). බැංකුව විසින් ජංගම ගිණුමට බැරකර තිබුණු එකතුව රු.441,812 ක් සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 31 දින වන විටත් පරීක්ෂා කර බලා රාජ්‍ය ආදායමට ගැනිමට අවශ්‍ය ක්‍රියමාර්ග දෙපාරතමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

## 5.10 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | ---------------- | ------------- | ------------- | ----------------- |
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 03 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 114 | 101 | 13 |
| (iii) | ද්විතියික මට්ටම | 454 | 347 | 107 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 11 | 10 | 01 |
| | | ----- | ----- | ----- |
| | **එකතුව** | **583** | **461** | **122** |
| | | === | === | === |